**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**

email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ජවිපෙ




ජවිපෙ අභ්‍යන්තර මතවාදී අර්බුදය අරභයා රටේ පළවන මාධ්‍ය හරහා අපට ලැබෙන තොරතුරුත් ඒ හරහා ජනතාවගේ මනස තුළ ජවිපෙ සම්බන්ධයෙන් ගොඩනැගෙන චිත්‍රයත් තරමක් ව්‍යාකූල එකක් බව ඒ හා කෙරෙන කතාබහෙන් අපට තේරුම් ගත හැකි ය. දැනටමත් සියලුම මාධ්‍ය හරහා ඒ සම්බන්ධයෙන් ඇති පදම් තොරතුරු කියැවී ඇති හෙයින් ඒ පිළිබඳව කතා නොකර අපට ඇති පොදු අදහස සඳහන් කිරීම යෝග්‍ය යයි අපට සිතේ .

සෝමවංශලා සහ ගුණරත්නලාගේ සැබෑ අරමුණ කුමක් වුවද සාකච්ඡාවෙන් සම්මුතියෙන් සංවාදයෙන් විසඳාගත යුතු ප්‍රශ්නයක් හේතුකොට දෙපිරිසම ක්‍රම ක්‍රමයෙන් ළඟා වී සිටින්නේ අගාධයක මුවවිටට දැයි යන සැක සංකාව මතුවෙයි. සංවේගයට කරුණ නම් දෙපිරිසම තමන් මේ කේවල් කරමින් සිටින්නේ දස දහස් ගණනකගේ ජීවිත පරිත්‍යාගයෙන් ලේ කඳුලු දහඩිය මතින් ගොඩනැගුණු ශක්තියේ එකතුවකට බව අමතක වී තිබීමයි.

ශ්‍රේෂ්ට නායක මාවෝ සේතුං වරක් කී පරිදි සියක් ගුරුකුල ගැටී දස දහසක් මල් පිබිදිය යුතුය. එහෙත් ඒ සඳහා යහපත් ආදර්ශයක් සහ ඇරඹුමක් තිබිය යුතුය. ඒ ඇරඹුම සඳහා තේරුම් ගත යුතු මූලිකම කාරණය මේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් දෙකම පක්ෂයේ උන්නතිය වෙනුවෙන් තම ජීවිතකාලයම කැප කළ පුද්ගලයන් යන්න ය. ප්‍රතිවිරුද්ධ අදහස් දරන්නන් ද්‍රෝහීන් ලෙස හංවඩු ගැසීමේ ඉතිහාස-යට දැන්වත් නැවතුම් තිත තැබිය යුතු ය. එයම යහපත් ගමනකට හොඳ ආරම්භයක් වනු ඇත.

"Let a thousand flowers bloom, a hundred schools of thought contend" - Mao Tse-Tung

## අපේ රාජාණ්ඩුව

අප හිතා හිටියේ ශ්‍රී ලංකාවේ ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් බවත් එහි නායකයා ජනාධිපතිතුමා බවත් ය. එය එසේ නොවන බව උන් හිටි ගමන් අපට මතක් කර දුන්නේ අපේ ජනමාධ්‍යයකි. එක පැත්තකින් කල්පනාකරගෙන යනවිට ඒ කතාවද ඇත්තකි. දකින්නට ඇති ලක්ෂණ අනුව අපේ රටේ දැන් ඇත්තේ රාජාණ්ඩුවක්ම බව අපටද පෙනී යයි. රාජාණ්ඩුවක නායකයා රජතුමා ය. යුවරජ කමට ගන්නේ ද තමන්ගේම කෙනෙකි. ඊළඟ රජ කම හිමිවන්නේ ද තමන්ගේම පුතාට ය. රජයේ සියලුම මර්මස්ථාන වලට පත් වන්නේ ද රජතුමාගේ ඥාති හිතවතුන් ය. එක අතකින් එය සාධාරණය. මන්ද දිග කාලයක් බලයේ සිටින්නට නම් ඒ වගේ ආරක්ෂා පවුරක් සාදා ගත යුතුම ය.

එසේම රාජාණ්ඩුවක මහජන මතයට තැනක් නැත. රජතුමා දෙන දෙයක් කා වෙන දේ බලා ඉන්නවා ඇරෙන්නට වෙන යම් දෙයක් කරන්නට මහජනතාවට අවසර නැත. අවසාන තීරණය රජතුමාගේ ය. ඕනෑ නැති පණ්ඩිතකම් කරන අයට සිදුවන්නේ හිස් ගැසුම් කන්නටය. නැත්නම් නෝනිස් දොස්තර මහතාට සිදවූවා සේ පොලු පාර කන්නටය.

වැරදිලාවත් නාහෙටම නාහන එවුන් ටිකක් කැරැල්ලක් හෙම පටන් ගත්තොත් එය කුඩුපට්ටම් කළ හැකි රාජපුරුෂයෝ ද රජුට සිටිති. රජතුමාට ප්‍රශස්ති ගායනා කරන්නට කණ්ඩායමක්ද සිටියි.

ඉතින් මේ හැටියට බලාගෙන යන විට රාජාණ්ඩුවකත් අපේ ආණ්ඩුවකත් ඒ හැටි වෙනසක් ඇති බවක් නොපෙනෙයි. ඒ නිසා අපේ ජනාධිපතිතුමාට අපේ රජු යැයි කීමේ කිසිම වරදක් දොසක් නැත. අන්තිමේ කුංකුණාවේ හාමුදුරුවන් සතුටට පත් කරමින් අපටත් රජකෙනෙක් සිටින බව බව පෙන්නා දෙන්නට තරම් ධෛර්යයක් අපේ මාධ්‍යයකට තිබීම ගැන අපටත් ආඩම්බර ය. එසේ වුවත් "රජතුමා" යි කියා අපේ ජනාධිපතිතුමාට කෝචොක් කිරීම නම් හොඳ වැඩක් නොවේ

සංස්කාරක - සන්නස

